**කෘෂිකර්ම අමාත්‍යාංශය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය(PL 01 - 2006A) යටතේ III වන ශ්‍රේණියේ මුරකරු හා කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවීම - 2018

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පුරප්පාඩු වී ඇති මුරකරු හා කම්කරු තනතුරු සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි:*

1.1 මුරකරු තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් පමණක් ද, කම්කරු තනතුරු සඳහා කාන්තා සහ පිරිමි යන දෙපාර්ශයටම ද අයදුම් කල හැකිය .

1.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්වේ. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර, රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

1.3 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් 2009.02.20 දිනැති අංක1589/30 *ගැසට් පත්‍රයේ* පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අදාළ වේ.

1.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද , මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද, යටත් විය යුතුය.

2. *සාමාන්‍ය සුදුසුකම්:*

2.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

2.2 යහපත් චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු , මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

2.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි පුද්ගලයන් වියයුතුය.

2.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වන පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

3. *අධ්‍යාපන සුදුසුකම්:*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

4. *වෙනත් සුදුසුකම්:*

4.1 වෙනත් අධ්‍යාපනික සුදුසුකම්, ක්‍රීඩා කුසලතා හා විශේෂ පුහුණු සහතික පත්‍ර විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

4.2 සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කම්කරු හා මුරකරු තනතුරේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ. අයදුම්කරුවන්

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිවම අයදුම්පතේ සඳහන් කළ යුතුය.

6. *වැටුප් පරිමාණය (මාසික) :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි PL 1- 2016 වැටුප් ඛාණ්ඩය යටතේ රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x330 - රු. 36,410/- වේ.

7. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් විසින් ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර, අයදුම්පත්‍රය 2018.05.04 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. බඳවා ගැනීමට සුදුසුකම් ලබන සියළුම නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටින බැව් අවධාරණය කරන අතර පළමු පත්වීම ලබන දිස්ත්‍රික්කය තුල අවම ලෙස වසර 05 ක් වත් සේවය කිරීම අත්‍යවශ්‍ය වන අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කල යුතුය.

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත්‍රය.

8.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය,

8.3 වලංගු රියදුරු බලපත්‍රය.

9. මුරකරු තනතුර සඳහා ඉල්ලුම්කරනු ලබන අයදුම්කරුවන් පමණක් මාස 03ක් ඇතුලත ලබාගත් ග්‍රාමසේවා සහතිකයක් සහ පොලිස් වාර්තාවක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් වන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2018 මාර්තු මස 23 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ.පෙ. 537,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ මුරකරු හා කම්කරු තනතුරු සඳහා වන අයදුම්පත්‍රය**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

අයදුම් කරන භාෂා මාධ්‍යය :
සිංහල (2)
දෙමළ (3)
ඉංග්‍රීසි (4) (අදාළ අංකය යොදන්න)

ඉල්ලුම් කරන තනතුර :
(කොටුව තුළ කතිරය යොදන්න)

| | | | |
|---|---|---|---|
| මුරකරු | | කම්කරු | |

1. ස්ත්‍රී පුරුෂ භාවය :
(කොටුව තුළ කතිරය යොදන්න)

| | |
|---|---|
| | |
| ස්ත්‍රී | පුරුෂ |

2. විවාහක/අවිවාහක බව :
(කොටුව තුළ කතිරය යොදන්න)

| | | | |
|---|---|---|---|
| විවාහක | | අවිවාහක | |

3. මුලකුරු සමග නම : ..........................................................................................................................................

4. සම්පූර්ණ නම : ..........................................................................................................................................

5. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

6. ස්ථිර ලිපිනය : ..........................................................................................................................................

..........................................................................................................................................

7. උපන්දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

8. වයස : අවු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]
(අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට)

9. දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

10. අධ්‍යාපන සුදුසුකම් :

| | | | | | |
|---|---|---|---|---|---|
| පළමුවර | | | දෙවනවර | | |
| වර්ෂය | | | වර්ෂය | | |
| විභාග අංකය | | | විභාග අංකය | | |
| අනු අංකය | විෂය | ශ්‍රේණිය | අනු අංකය | විෂය | ශ්‍රේණිය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

11. වෙනත් සුදුසුකම් :
..........................................................................................
..........................................................................................

12. සේවය කිරීමට කැමති දිස්ත්‍රික්ක 05ක් තම අභිමතය පරිදි ප්‍රමුඛතා පදනම මත :

1. ............................................
2. ............................................
3. ............................................
4. ............................................
5. ............................................

13. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න. ඔව් නම් විස්තරය සඳහන් කරන්න.)

නැත ☐ ඔව් ☐

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

14. අයදුම්කරුගේ සහතිකය :

අ. මෙම ඉල්ලුම් පත්‍රයේ ම' විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කරුණක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟවෙමි. තව ද, මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ආ. මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

දිනය:.....................

.........................................
අයදුම්කරුගේ අත්සන